සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| පළමු වාර පරීක්ෂණය 2018 | 6 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை 2018 | தரம் 6 |
| First Term Test 2018 | Grade 6 |

| | | |
|---|---|---|
| ඉතිහාසය | I, II | පැය දෙකයි |
| வரலாறு | I, II | இரண்டு மணித்தியாலம் |
| History | I, II | *Two hours* |

විභාග අංකය ..........................................................................................................................

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

## **I -** කොටස

- අංක **01** සිට **05** දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**01.** මහාවංශය රචනා කරන ලද්දේ,

**(1)** මහානාම හිමියන් ය. **(2)** ධර්මසේන හිමියන් ය.

**(3)** ධාතුසේන රජු ය. **(4)** මහසෙන් රජු ය.

**02.** පාසලේ ඉතිහාසය හැදෑරීමට ප්‍රධාන මූලාශ්‍රයකි.

**(1)** සෙල්ලිපි **(2)** කාසි

**(3)** නටඹුන් **(4)** ලොග් පොත්

**03.** ක්‍රිස්තුස් වහන්සේගේ උප්පත්තියට පෙර කාලය හඳුන්වන්නේ,

**(1)** ක්‍රිස්තු වර්ෂ නමින් ය. **(2)** ක්‍රිස්තු පූර්ව නමින් ය.

**(3)** බුද්ධ වර්ෂ නමින් ය. **(4)** හිජ්රි වර්ෂ නමින් ය.

**04.** වසභ රජුගේ රාජ්‍ය කාලය ආරම්භ වන්නේ,

**(1)** ක්‍රි.ව. 247 දී. **(2)** ක්‍රි.ව. 67 දී.

**(3)** බුද්ධ වර්ෂ 544 දී. **(4)** බුද්ධ වර්ෂ 249 දී.

**05.** විශාල සතුන්ගේ ඇටකටු භාවිතා කර නිවාස ඉදිකළ මානවයා වන්නේ,

**(1)** හෝමෝ සාපියන් ය. **(2)** හෝමෝ ඉරෙක්ටස් ය.

**(3)** හෝමෝ නියැන්ඩතාලෙසින් ය. **(4)** හෝමෝ හැබිලිස් ය.

- අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) **ලකුණ ද වරහන තුළ යොදන්න.**

**06.** දූවිලි වළාවක් නිහාරිකාවක් යනුවෙන් ද හැඳින්වේ. ( )

**07.** අවුරුදු මිලියන හාරසිය විස්සකට ඉහත කාලය සිලූරියන් යුගය ලෙස හැඳින්වේ. ( )

**08.** ලෝකයේ මුල්වරට ජීවය බිහිවූයේ ගොඩබිම තුළ ය. ( )

**09.** මිනිසා පළමුවරට ගින්දර භාවිතා කළ බවට සාක්ෂි ඊශ්‍රායලයෙන් සොයාගෙන ඇත. ( )

**10.** පුරා ශිලා යුගයේ මිනිසුන් කණ්ඩායම් ලෙස එළිමහනේ ජීවත් විය. ( )

- අංක 11 සිට 15 දක්වා වගන්තිවල හිස්තැනට අදාළ පිළිතුර පහත දී ඇති වචන වලින් තෝරා ලියන්න.

**11.** වී වගාව මුල්වරට ආරම්භ වන්නේ .................................................. ය.

**12.** උතුරු ඇමරිකාවේ .................................................. නැමති ජනවර්ගය වාසය කරයි.

**13.** රබර් බෝලය සාදන ලද්දේ .............................................. ශිෂ්ටාචාරයට අයත් වැසියන් ය.

**14.** මිනිසා මුල්වරට ගම්මාන තනා ගත්තේ ක්‍රි.පූ. ............................................. දී පමණ ය.

**15.** චිම්පන්සියෙකුගෙන් මිනිසෙකු දියුණු වූ ක්‍රියාවලිය ...................................................... යනුවෙන් හඳුන්වයි.

(කොකසොයිඩ්, චීනයේ ය, මායා, ඉන්දියාවේ ය, මානව පරිණාමය, 6000)

- **අංක 16 සිට 20 දක්වා** "අ" තීරුවට ගැලපෙන යෙදුම "ආ" තීරුවෙන් තෝරා යා කරන්න.


| **"අ" තීරුව** | **"ආ" තීරුව** |
|---|---|
| **16.** ලෝකයේ මුලින්ම ජීවීන් බිහි වීම. | **A.** මහා හිම යුගය |
| **17.** පෘථිවිය බිහි වීම. | **B.** හෝමෝ නියැන්ඩතාලෙන්සිස් |
| **18.** අධික සීතල දේශගුණය සහිත කාලය | **C.** සිලූරියන් යුගය |
| **19.** දෙපයින් ඇවිද ගිය මානවයා | **D.** ජලය |
| **20.** දඩයක්කරුවා ලෙස හැඳින්වීම | **E.** දූවිලි වලාව |
| | **F.** ඔස්ට්‍රලෝපිතිකස් |

**II -** කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.

---

**01.** පහත සඳහන් පින්තූර අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

**(අ)** 

**(i)** පින්තූරයේ දැක්වෙන්නේ කුමක්ද ?

**(ii)** මෙය නිපදවීමට ගත් ද්‍රව්‍යක් නම් කරන්න.

**(iii)** මෙය භාවිත කරමින් සිදුකළ කාර්යයක් ලියන්න.


**(ලකුණු 02 × 03 = 06)**

**(ආ)** 

**(i)** මෙම පින්තූරය නම් කරන්න. **(ලකුණු 02)**

**(ii)** මෙය අයත්වන කාලය නම් කරන්න. **(ලකුණු 02)**

**(iii)** මෙය සෑදීමට ගත් අමුද්‍රව්‍ය 02 ක් ලියන්න. **(ලකුණු 04)**

**(ඇ)** 

**(i)** පින්තූරයේ දැක්වෙන මානවයා නම් කරන්න.

**(ii)** ඔහු හැඳින්වූ අන්වර්ත නාමය ලියන්න.

**(iii)** එම මානවයා සතු හැකියා 02 ක් ලියන්න.

**(ලකුණු 02 × 03 = 06)**

**02. (i)** ඉතිහාසය ඉගෙනීමේදී කාලය මැනීමට භාවිතා කරන ක්‍රම 02 ක් නම් කරන්න. **(ලකුණු 02)**

**(ii)** ඔබ පාසලේ ඉතිහාසය ඉගෙනීමට යොදාගත හැකි මූලාශ්‍ර 03 ක් නම් කරන්න. **(ලකුණු 03)**

**(iii)** ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන 05 ක් ලියන්න. **(ලකුණු 05)**

**03. (i)** පහත සඳහන් වර්ෂ බුද්ධ වර්ෂ ක්‍රමයට හරවා ලියන්න.

**(A)** ක්‍රි.ව. 274

**(B)** ක්‍රි.ව. 67 **(ලකුණු 02)**

**(ii)** පහත සඳහන් මූලාශ්‍ර අයත්වන කාණ්ඩයට ඇතුළත් කර වගුව සම්පූර්ණ කරන්න.

- මහාවංශය
- සෙල්ලිපි
- දීපවංශය

- පුස්කොළ පොත්
- කාසි
- ථූපවංශය
- නටඹුන්
- ඇටසැකිලි

| සාහිත්‍ය මූලාශ්‍ර | පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර |
|---|---|
| **1.** | **1.** |
| **2.** | **2.** |
| **3.** | **3.** |
| **4.** | **4.** |

**(ලකුණු 08)**

**04. (i)** පහත A සහ B යටතේ දැක්වෙන ලක්‍ෂණ පෙන්නුම් කරන මානවයා වරහන තුළින් තෝරා ලියන්න.

A - හැකි මිනිසා

B - ගින්දර භාවිතා කළ මිනිසා

(හෝමෝ හැබිලිස්, හෝමෝ ඉරෙක්ටස්) **(ලකුණු 02)**

**(ii)** මහා හිම යුගයේ කැපී පෙනෙන ලක්‍ෂණ 03 ක් ලියන්න. **(ලකුණු 03)**

**(iii)** මිනිසා, සතුන්ගෙන් වෙන්කර හඳුනාගත හැකි ලක්‍ෂණ 05 ක් ලියන්න. **(ලකුණු 05)**

**05. (i)** ගොවි යුගයේ වගා කළ ධාන්‍ය වර්ග 02 ක් නම් කරන්න. **(ලකුණු 02)**

**(ii)** පුරා ශිලා යුගයේ මානවයා දියුණු කරගත් හැකියාවන් 03 ක් නම් කරන්න. **(ලකුණු 03)**

**(iii)** නව ශිලා යුගයේ මානවයා සතුන්ගෙන් ලබාගත් ප්‍රයෝජන 05 ක් ලියන්න. **(ලකුණු 05)**

**06. (i)** ගොවි යුගයේ මිනිසා උපකරණ තැනීමට භාවිත කළ ද්‍රව්‍ය 02 ක් නම් කරන්න. **(ලකුණු 02)**

**(ii)** විවේකය ලැබීම නිසා ගොවි යුගයේ මිනිසා යෙදුනු වෙනත් කටයුතු 03 ක් ලියන්න. **(ලකුණු 03)**

**(iii)** ශිෂ්ටාචාර බිහිවීම සඳහා හේතු වූ කාරණා 05 ක් ලියන්න. **(ලකුණු 05)**

**07. (i)** පහත සඳහන් රටවල් වල ජීවත්වන මානව වර්ග වරහන් තුළින් තෝරා ලියන්න.

A - අප්‍රිකාව

B - ඉන්දියාව

(නීග්‍රොයිඩ්, ඔස්ට්‍රොලොයිඩ්) **(ලකුණු 02)**

**(ii)** ලෝකයේ පැරණිම ශිෂ්ටාචාර 03 ක් නම් කරන්න. **(ලකුණු 03)**

**(iii)** ඉපැරණි ශිෂ්ටාචාර වලින් අප ලද දායාද 05 ක් ලියන්න. **(ලකුණු 05)**